කෘෂි නවීකරණ ව්‍යාපෘතිය
விவசாய நவீனமயமாக்கல் திட்டம்
Agriculture Modernization Project

# කෘෂිකර්ම අමාත්‍යාංශය
# කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය (ASMP)

## ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම (කොළඹ)

කෘෂිකර්ම අමාත්‍යාංශය, ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය (IDA) හා සමග දේශ හවුල්කාරිත්ව උපායමාර්ග (CPS) හා එක්ව යමින් කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන අතර, එහි අපේක්ෂාව කුඩා පරිමාණ ගොවීන් විසින් තරගකාරී හා ඇලෙවියට හැකියාව සහිත වෙළඳ භාණ්ඩ නිපදවීම සඳහා සහායවීම, වෙළඳපොළ අවශ්‍යතා වැඩිදියුණු කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීම හා වැඩි වර්ධනය වූ වාණිජ්‍යකරණයක් සඳහා යොමුවීම වේ. ඉතිරිව ඇති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාලය වසර 2 ක් පමණ වන අතර, ව්‍යාපෘතියෙහි ඇස්තමේන්තුගත පිරිවැය ඇමරිකන් ඩොලර් මිලියන 64.23 ක් වේ.

ඒ අනුව 2019.03.05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 ප්‍රකාරව, කොළඹ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි (PMU) පවත්නා පහත සඳහන් ඇබෑර්තුව පිරවීම සඳහා එහි සඳහන් සුදුසුකම් හා පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. අභ්‍යන්තර විගණක (PS4) - තනතුරු 01

- **අවශ්‍ය සුදුසුකම්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කොට තිබීම,

   **හෝ**

   I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධියට සමාන බවට පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම්,

   **හෝ**

   II. පිළිගත් වෘත්තීය ආයතනයක, අදාළ ක්ෂේත්‍රයේ ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්,

   **සමග**

   අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන්, සුදුසුකම් ලැබීමෙන් පසු වසර 07 ක පළපුරුද්ද

2. රජයේ දීපව්‍යාප්ත සේවයේ III / II පන්තිය හෝ ඉහළ නිලධාරියකු වීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තනතුරක්,

   **සමග**

   III/II තනතුරක අවම වශයෙන් වසර 07 ක පළපුරුද්ද

- අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනය වන විට වයස අවුරුදු 64 කට නොවැඩි විය යුතුය.
- විගණන පළපුරුද්ද සහිත අයදුම්කරුවන්හට ප්‍රමුඛතාව හිමිවේ.
- ප්‍රසම්පාදන කාර්යයන්හි දැනුම / පළපුරුද්ද සතුවීම තනතුරට බෙහෙවින් අදාළ වන අතර, ඊට ප්‍රමුඛස්ථානය ලබා දෙනු ලැබේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :**

සුදුසුකම් හා පළපුරුද්ද මත තෝරාගනු ලබන අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කොට සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

**වැටුප් පරිමාණය :**

වැටුප්, 2019.03.05 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය මත ගෙවීම් සිදු කෙරේ.

**සේවයේ යෙදවීමේ කොන්දේසි :**

රජයේ සේවයට අයත් නිලධාරීන් ද්විතියක පදනමින් බඳවා ගනු ලබන අතර, රජයේ සේවයට පරිබාහිර අයවලුන් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගැනේ. සියලුම පත්කිරීම්, මූලිකව වසර එකක් සඳහා වන අතර, සේවය දීර්ඝ කිරීම්, සාර්ථක කාර්ය සාධනය මත සිදු කෙරෙනු ඇත.

**අයදුම්පත් :**

අයදුම්කරුවන් විසින් සියලු ජීව දත්ත, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ විස්තර හා සහතිකවල පිටපත් සමග තම අයදුම්පත්, ලියාපදිංචි තැපෑලෙන්, පහත සඳහන් ලිපිනය වෙත 2021 මැයි 19 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. දැනට රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතනවල සේවය කරනු ලබන අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතු වේ.

(2020.10.09 දින පළ කරන ලද පුවත්පත් නිවේදනය ප්‍රකාරව දැනටමත් අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් යළිත් අයදුම්පත් යොමු කිරීම අවශ්‍ය නොවේ)

අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර හා ව්‍යාපෘති නාමය පැහැදිලිව සඳහන් කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ**
**කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතිය**
**(කෘෂිකර්ම අමාත්‍යාංශය)**
**අංක 123/2, පන්නිපිටිය පාර, බත්තරමුල්ල.**

Source: Dinamina, Daily News (2021.05.05)